# ජෝන් කීල්ස් සහ ChildFund වෙතින් සෞන්දර්ය වැඩමුළු



COVID-19 සහ ආර්ථික අර්බුදයේ බලපෑම වැනි හේතු නිසා යොවුන් පරපුරට දැඩි මානසික පීඩාවන්ට මුහුණ දීමට සිදු වී තිබේ. මීට පිළියමක් වශයෙන් ජෝන් කිල්ස් පදනම ChildFund Sri Lanka සමග එක්වී, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ සහ කොළඹ මහනගර සභාවේ දායකත්වයද සමගින් කොළඹ 02 ප්‍රදේශයේ දරුදැරියන් සහ තරුණ තරුණියන් වෙනුවෙන් සෞන්දර්ය වැඩමුළු මාලාවක් පැවැත්වීමට කටයුතු කළේ ය.

2021 වසරේදී ආරම්භ කරන ලද මෙම වැඩසටහන යටතේ මාස 9 ක කාලයක් තුළ චිත්‍ර, රංග කලාව, සංගීතය සහ නර්තනය යන විෂයන් සම්බන්ධ වැඩමුළු 48 ක් පවත්වන ලදි. දෘශ්‍ය කලා විශ්ව විද්‍යාලයේ මහාචාර්ය සෞම්‍ය ලියනගේ ප්‍රධානත්වයෙන් යුත් කණ්ඩායමක් විසින් මෙහෙයවන ලද මෙම වැඩමුළු මාලාවට වයස අවුරුදු 15 ත් 24 ත් අතර තරුණියන් 70 දෙනෙක් (ගැහැනු 43 ක් සහ පිරිමි 27 ක්) සහභාගී වූහ.